# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## රජයේ දීප ව්‍යාප්ත සේවා තනතුරු වලට නිලධාරින් බඳවා ගැනීම සඳහා පොදු තරඟ විභාගයක් පැවැත්වීම පිළිබඳ නිවේදනය

රාජ්‍ය සේවයේ දීප ව්‍යාප්ත සේවාවන්හි පවතින ඇබෑර්තු පිරවීම සඳහා ඒ ඒ සේවාවන් සඳහා වෙන වෙනම තරඟ විභාග පැවැත්වීම වෙනුවට එක් තරඟ විභාගයකින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා 2020 නොවැම්බර් 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව මෙම විභාගය පහත සඳහන් පරිදි පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ.

1. <u>විභාග ව්‍යුහය :-</u>

මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ. එනම්,

1 කොටස - (පොදු කොටස)

2 කොටස - (ඒ ඒ සේවාවන් සඳහා විශේෂිත වූ කොටස)

<u>1 කොටස</u> :- මෙම කොටස සියළුම දීප ව්‍යාප්ත සේවාවන් සඳහා පොදු වන අතර එය පහත සඳහන් විෂයයන් දෙක සඳහා වූ ප්‍රශ්න පත්‍ර 2 කින් යුක්ත වේ.

ප්‍රශ්න පත්‍රය 1 : බුද්ධි පරීක්ෂණය

ප්‍රශ්න පත්‍රය 2 : අවබෝධය

<u>2 කොටස</u> :- ඉහත 1 කොටසේ සඳහන් විෂයයන් දෙකට අමතරව ඒ ඒ දීපව්‍යාප්ත සේවාවන් වලට අදාළ සේවා ව්‍යවස්ථාවන්හි තවත් විෂයයන් සඳහන්ව ඇත්නම්, එම විෂයයන් මෙම 2 කොටස යටතේ ඇතුළත් වේ. (මෙම විෂයයන් පිළිබඳ විස්තර අයදුම්පත්‍ර කැඳවන අවස්ථාවේදී සඳහන් කරනු ඇත.)

2. <u>විභාගය පැවැත්වීමේ ක්‍රමය :-</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මෙම විභාගය සෑම වසරකම නිශ්චිත වූ කාල වකවානුවකදී පවත්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර කැඳවීම මාර්ගගතව (Online)

7/100

සිදු කරනු ලබන අතර, එක් ඉල්ලුම් පත්‍රයක් මගින් අපේක්ෂකයා සුදුසුකම් ලබන දීප ව්‍යාප්ත සේවාවන් ඕනෑම සංඛ්‍යාවකට ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. එහිදී අපේක්ෂකයා විසින් ඒ ඒ සේවාව සඳහා සළකුණු කරනු ලබන මනාප අනුපිළිවෙළ පසු අවස්ථාවකදී වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

මෙම විභාගය කොළඹ දී හා බැහැර ප්‍රදේශයන්හි දී අවස්ථාවෝචිත පරිදි පවත්වනු ලැබේ. විභාගයේ ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු නොලබන අතර, අපේක්ෂකයින් විසින් අන්තර්ජාලය ඔස්සේ බාගත කර ගත යුතුය.

විභාගයේ 1 කොටස (පොදු කොටස) සඳහා සියළුම අපේක්ෂකයින් පෙනී සිටිය යුතු අතර, එහිදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක්ද, ප්‍රශ්න පත්‍ර දෙකෙහි ලකුණු වල එකතුව 100 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්ද ලබා ගන්නා අපේක්ෂකයින් පමණක් විභාගයේ 2 කොටස සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබනු ඇත. විභාගයේ 2 කොටස සඳහා එක් එක් අපේක්ෂකයා සුදුසුකම් ලබා ඇති / නැති බව ප්‍රසිද්ධ කරනු ලැබේ.

සෑම අපේක්ෂකයෙකුට තමන් ඉල්ලුම් කර ඇති සියලුම විෂයන්ට පෙනී සිටීමට හැකි වන පරිදි 2 කොටසෙහි විභාග කාල සටහන පිළියෙල කරනු ලැබේ.

3. <u>දීප ව්‍යාප්ත සේවාවන් සඳහා තෝරා ගන්නා ආකාරය :-</u>

මෙම විභාගයේදී අපේක්ෂකයන් ඒ ඒ සේවාවට අදාළව ලබා ගන්නා ලකුණු ප්‍රමාණය පදනම් කර ගනිමින් ඒ ඒ දීප ව්‍යාප්ත සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට තෝරා ගැනීම සිදු කරනු ලැබේ. එසේ තෝරා ගැනීම සඳහා මෙම විභාග ක්‍රමය අදාළ කර ගැනීමට හැකි වන පරිදි ඒ ඒ දීප ව්‍යාප්ත සේවයේ සේවා ව්‍යවස්ථා අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

2021 වර්ෂයේ සිට මෙම විභාග ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර, පහත සඳහන් සේවාවන් හා ධාරාවන් සඳහා මෙම විභාග ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන දැනටමත් සිදු කර ඇත.

1. ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව
2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව හා සීමිත ධාරාව
3. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව
4. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව
5. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව

සේවා ව්‍යවස්ථා අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමෙන් අනතුරුව අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවන් සඳහා ද ඉදිරියේදී මෙම විභාග ක්‍රමය හඳුන්වා දීමට කටයුතු

කරනු ලැබේ. කෙසේ වුවද, එසේ සංශෝධනය කරනු ලබන තෙක් ඒ ඒ සේවය සඳහා දැනට පවතින විභාග ක්‍රමය නොවෙනස්ව පවත්වනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ජේ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2021.04.28